# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/43 - 2019 මාර්තු මස 27 වැනි බදාදා - 2019.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් (2017 ජූනි මස 14 වන දින අංක 2023/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2007 ඔක්තෝබර් මස 9 වන දින අංක 1518/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනය, මෙහි I වන තීරයේ දැක්වෙන ''කලා පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ දක්වෙන ''16. නීති අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම, පහත දක්වෙන සටහන් ඇතුලත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''17. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය

18. මාධ්‍ය අධ්‍යයන අධ්‍යනාංශය''.

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

04 - 344

1A - PG 4449 — 518 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*